**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**විෂය-නර්තනය**

**දෙවන වාරය - මැයි - සතිය - 03**

**ශ්‍රේණිය-9**

සැකසුම:-එම්.කේ.සී දිල්රුක්ෂි මිය
ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය, කරවිට

**1.පාඩම හෝ ඒකකය :-** 4.2 **ජන ගී ගායන ඉදිරිපත් කරමු.**

**2.ශිෂ්‍යා කළ යුතු කාර්යන් :-**

- පළමුවෙන්ම මෙම ගායනා ශ්‍රවණය කරන්න.ඒ සඳහා පහත Link භාවිතා කරන්න.
- කියවීම් පත්‍රිකාවට අදාල කවි සටහන් කරගන්න.
- දක්වා ඇති නාද මාලා අනුව ගායනයට හුරු වන්න.
- කිහිප වරක් නිවැරදි නාද මාලා අනුගමනය කරමින් දුර්වලතා මග හරවා ගත හැකියි.
- ඒ අනුව ඔබට නිවැරදි ගායනා ශෛල හඳුනා ගත හැකියි.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් ,website ,LMS ,පාඩම් හා ඉගෙනුම් ආධාරක :-**

- **e-තක්සලාව- 09 ශ්‍රේණිය**
- **e-නැණපියස :- 09 ශ්‍රේණිය නර්තනය**
- **you Tube-**
  https://you.be/2yth3GoVFLO
  https://you.be/nr-yraokvc
  https://youtu.be/UpAX6eabHY
  https://you.be/Y9j7BIWDBW8
  https://youtu.be/VvPodHgvDhs
- **කියවීම් පත්‍රිකාව :-** ගායනා පුහුණු වීම සඳහා පහත දැක්වෙන ඇමිණුම් යොදා ගන්න.

**කඩතුරා කවි**

1.සිහින් සිනිඳු සළුව පැළැඳ විත් උන් මරගන
වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ උණ
අහංකාර ඒ මරගන දැක්කේ බුදු ගුණ
මිහින්තලා ධාතු බලෙන් කඩතිරි හරි මින

2.ඇත එපිට දීපංකර මුණි විවරණ ගත් නේ
මැත කපේ දී මතු බුදු වෙමැයි සිතා ගත් නේ
බූත පියස් යක්ෂ රෝග භය දුක් දුරලත් නේ
ජේතවනාරාමෙ බලෙන් කඩතිර හරිමින් නේ



**ගොයම් කවි**

1.රන් දෑ කැති ගෙන නිති සැරසෙනවා
රත් රන් පටි ඉණ වට දිලිසෙනවා
රිවි දුටු පිණිබිඳු ලෙස පහවෙනවා
දුම්බර කෙතේ අපි ගොයම් කපනවා

2.ඉරු දෙවියන්ගේ ඉර ගල ගාවා
සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා
ගණ දෙවියන්ගේ කෝවිල ගාවා
අපිත් කියමු කවි ගොවිපළ ගාවා



**පන් නෙළීමේ කවි**

1.ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මූණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිණුවන් පන් තියෙන කොට
නෑනො නුඹත් එනවද පන් නෙළන්නට


2.කොනින් කොනට පන් උදුරා ගන්නේ
තැනින් තැනට පන් අහුරු දමන්නේ
අනුන්ගෙ පන්කොළ එක් නොක රන්නේ
බැණුම් අහන්නට වෙයි දැන ගන්නේ



**සොකරි කවි**

1.සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නී

2.වෙදා නටන්නේ පළමුව සබේට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි කියන්නේ



- **පොත් පත් /සඟරා**
  අතිරේක කියවීම් අත්පොත(ජාතික අධ්‍යාපන ආයතනය)
  ඥානසිරි පීරිස් මහතාගේ 9 ශ්‍රේණිය නර්තනය කෘතිය

**4.මෙම සතිය තුළ නියමිත පාඩම් වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵලඃ-**

- ගායන වලට අදාල තිත් රූප නම් කරයි.
- නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායනය කරයි.
- බෙර වාදනයට අනුව තාල තබමින් ගායනය ඉදිරිපත් කරයි.
- ඒකීය හඬ තලයක පිහිටා ගායනය ඉදිරිපත් කරයි.
- ගායනය සාමූහිකව ඉදිරිපත් කරයි.

**5.ඇගයීම/තක්සේරුකරණ ක්‍රමවේදඃ-**

1. එක් එක් ගායන වලට විවිධ වූ නාදමාලා අති බවට කරුණු දක්වන්න.
2. ඒවා හා බැඳි සංස්කෘතික පසුබිම විස්තර කරන්න.
3. වන්නම් වල ඇති සුවිශේෂී බව හා එහි පසුබිම විස්තර කරන්න.
4. සොකරි ගායන වල ඇති ප්‍රාදේශීය වෙනස්කම් පිළිබඳ විමසුමක් කරන්න.
5. බෙර වාදනයට අනුව එම ගායනා ඉදිරිපත් කරන්න.

**සැකසුමඃ- එම්.කේ.සී. දිල්රුක්ෂි මිය**
**ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය**